10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

**ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.**

**2.7.1 නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු ශිල්පීය ක්‍රම අනුව නාට්‍ය පෙළක් රචනා කිරීම.**

(සිසුන් කණ්ඩායම් කර, ඔවුන්ගේ කණ්ඩායම්වලට ගුණාත්මක යෙදවුම් බෙදා දීම සිදු කරයි. ලිවීමට කොළ, ආදිය බෙදා දෙයි.) හොඳයි, දැන් හැම කණ්ඩායමකට ම පුවත්පත් ලිපියක්, කෙටි කතාවක්, චිත්‍ර කතාවක් තියෙනවා. විනාඩි කීපයක් අරගෙන ඕව කියවල බලන්න. නාට්‍යයක් ලියද්දි හරි දැන් ඕගොල්ලන්ට පුළුවන් ඕවගෙන් එකක් හරි දෙකක් හරි තුනම හරි යොදාගෙන නාට්‍යයක් ලියන්න. කොහොමද මේ වැඩේ ආරම්භ කරන්නේ, අපි පියවර වශයෙන් බලමු. පියවරක් කතා කරාට පස්සේ ඒ පියවරට අදාළ දේ කරමු. ලෑස්තිද? හොඳයි.

පළවෙනි පියවර

ඔබේ කණ්ඩායම තෝරාගත් කතාවට අදාළ නාට්‍යෝචිත සිද්ධි ඔය දුන්නු කොලේක සටහන් කරන්න. ඒ සිද්ධි අතර ප්‍රභල ප්‍රධාන සිද්ධියක් තියෙන්න පුළුවන්. ඒ සිද්ධිය වටා අනෙක් සිද්ධි ගොඩනගා ගන්න පුළුවන්. අපි කලින් පාඩම්වලදී නාට්‍යෝචිත අවස්ථා මොනවද කියල එක දැනගත්තා. ඒ අනුව හොයල ලියමු බලන්න.

දෙවෙනි පියවර

දැන් ඒ සිදුවීම් නාට්‍යයක් ගොඩනගන්න සුදුසුම විදියට පෙළගස්වන්න. එතකොට ක්‍රමයෙන් කුතුහලය වැඩිවෙලා, ගැටළු මතුවෙලා ගැටළු නිරාකරණය වෙන විදියට අංක කරගන්න පුළුවන්.

තුන්වෙනි පියවර

දැන් ඔබේ සිදුවීම් ටිකට ඕන කරන චරිත වෙනම කොලේක ලියාගන්න. ඒ එක්කම ඔය සිදුවීම් සිද්ධවෙන තැන ගැන අපිට අදහසක් තියෙන්න ඕනේ. අපි පැය එකහමාරක් විතර කරන්න පුළුවන් නාට්‍යයක් ලියන්නෙ නැති නිසා මේ සිදුවීම් හැම එකක්ම එකම තැනක සිද්ධ කරන්න පුලවන්නම් හොඳයි. ඔව් ඒක කරන්න විදියක් තියෙනවා. අපිට පුළුවන් මේ අතරින් ප්‍රධාන සිදුවීම් කිහිපයක් සිදුවෙන තැන නාට්‍යය පටන්ගන්න. වෙනත් චරිත මාර්ගයෙන් අනිත් සිදුවීම් ගැන කතා කරවල ඒ සිදුවීම් වුනු බව කියන්න පුළුවන්. නැත්නම් දෙව්කාව භාවිත කරන විදිය අනුව තැන් කීපයක් එකම වේදිකාවේ මවන්න පුලුවන්. ඒ ඕන ක්‍රමයක් කරන්න. තව තියන ගැටළු වැඩේ කරගෙන යන අතර අහන්න මම උදව් කරන්නම්.

හතරවෙනි පියවර

දැන් තියෙන්නේ ඒ ඒ සිදුවීම්වල ඉන්න චරිතවලට අදාළව ඒ සිදුවීමට අදාළව දෙබස් රචනා කිරීම කරන්න. ඒකට මුලින් ම කරන්න තියෙන්නේ අදාළ පරිසරය විස්තර කරන එක. ඊට පස්සෙ රංග විධාන ද ඇතුළත්ව දෙබස් සහිතව රචනය සිදු කරන්න පුළුවන්.

හරි දැන් හැමෝම තමන්ගෙ කණ්ඩායමේ නාට්‍ය පිටපතක් රචනා කරයි තියෙන්නේ. ලේසි වැඩක් නොවයි ඔයාප කළේ. දැන් අපි ඔය පිටපත් ටික අරගෙන කණ්ඩායම් අතර බෙදමු. හරි. දැන් එක එක පිටපත් කියවන්න අවස්ථාව දෙනවා. හරි, දැන් එක එක ගැන අපි කතා කරමු. අඩුපාඩු හදාගමු. අපි ඊළඟ දවසේ හොඳම පිටපත තෝරලා රඟපාන්න සූදානම් කරනවා. මේ කියපු අඩුපාඩුත් ඊළඟ දවසෙ හදාගෙන පන්ති කාමරයට එන්න.